**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2018**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ඡේද අංක 87 අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ කිසිඳු අතිවිශේෂ අයිතමයක් ඉදිරිපත් නොකළ යුතු වුවත් රු.996,420ක අතිවිශේෂ අයිතම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ අන්තර්ගත කර තිබුණි. | නිරීක්ෂණය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ කිසිඳු අතිවිශේෂ අයිතමයක් ඉදිරිපත් නොකළ යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 | | |
| | i. ඡේද අංක 07 අනුව ගබඩාවට භාණ්ඩ භාරගත් දිනයට ස්ථාවර වත්කම් හා වගකීම් ලෙස හඳුනාගත යුතු වුවත් භාණ්ඩ සඳහා ගෙවීම් කල දිනය පදනම් කරගෙන ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.1,044,033ක් හා 2018 දෙසැම්බර් 31 දිනට රු.417,735ක් වූ ස්ථාවර වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නියමිත කාලපරිච්ඡේදයට හඳුනාගෙන නොතිබුණි | 2020 වර්ෂයේ sage මෘදුකාංගය මගින් ගිණුම් තැබීමේදී මෙම තත්ත්වය ඇති නොවන බව | ස්ථාවර වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නියමිත කාලපරිච්ඡේදයට හඳුනාගත යුතුයි. |

| | | |
|---|---|---|
| ii. ඡේද අංක 36 අනුව, ඉඩම් වැඩි දියුණු කිරීම් තුළ රු.920,218,001ක ප්‍රත්‍යාගණිත වත්කම් ද රු.40,378,715ක ප්‍රත්‍යාගණිත නොවූ වත්කම් ද ගොඩනැගිලි වත්කම් තුළ රු.320,038,183ක ප්‍රත්‍යාගණිත වත්කම් රු.160,605,637ක ප්‍රත්‍යාගණිත නොවූ වත්කම්ද අන්තර්ගත වී තිබුණි .ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට වූ මෙම වත්කම් අගය ප්‍රත්‍යාගනිත අගය හා පිරිවැය යන පදනම් දෙකෙන්ම සකස්වී තිබුණි. | 2019 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව | ප්‍රත්‍යාගණනයේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතුයි. |
| iii. ඡේද අංක 52 අනුව වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගය ඉක්මවා ගියද වත්කමේ අවශේෂ වටිනාකම එහි ධාරණ අගය නොඉක්මවිය යුතු වුවත් පිරිවැය රු.412,145ක් වූ විවිධ වත්කම් වල සමුච්චිත ක්ෂය රු.749,288ක් වී තිබුණි. | 2019 ප්‍රත්‍යාගණනය අනුව නිරවුල් කරන බව | වත්කමක අවශේෂ වටිනාකම එහි ධාරණ අගය නොඉක්මවිය යුතුයි. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40ප්‍රකාරව බදු කුලී ආදායම් ලබන කාර්මික ජනපද දේපල ආයෝජන දේපල ලෙස වෙන් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිතිය අදාල කරගැනීම පිළිබඳ විශේෂ මතය විමසා 2019 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන බව | බදු කුලී ආදායම් ලබන දේපල ආයෝජන දේපල ලෙස වෙන් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෙළිදරව් කලයුතුයි. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.791,535ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් කාර්මික ජනපද නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි | 2019 මූල්‍ය ප්‍රකාශ මඟින් නිවැරදි කරන බව | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කලයුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.42,340,204ක් වූ කෙරීගෙනයන වැඩ හා ඒ සඳහා ගෙවිය යුතු වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2019 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට පෙර විශේෂ මතය විමසා ඒ අනුව ක්‍රියා කරන බව | කෙරීගෙනයන වැඩ හා ඒ සඳහා ගෙවිය යුතු වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් කලයුතුයි. |
| (ඇ) | ගොඩනැගිලි වත්කම් අයිතම් කිහිපයක් වෙනත් වත්කම් පන්තියකට මාරුකිරීමේදී වටිනාකම රු.2,586,359ක් වූ සමුච්චිත ක්ෂය ගොඩනැගිලි වත්කම් ලේඛනයෙන් ඉවත් නොවීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වත්කම් ධාරණ අගයට එකතු වී තිබුණි | 2019 වත්කම් ලේඛනය නිවැරදිව ඉදිරිපත් කරන බව | ගොඩනැගිලි වත්කම් ලේඛනය යාවත්කාලීන කලයුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයට අදාලව ඉන්වොයිස් කරන ලද රු.1,106,000ක් වූ විකුණුම් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් ප්‍රමිත 18 ප්‍රකාරව ගිණුම් තැබීම සිදු කරන බව | සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම් පමණක් ගිණුම්ගත කලයුතුයි. |

**1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙණු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(11) ඡේදය ප්‍රකාරව අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරිනියක මණ්ඩලයේ මානව සම්පත් අධ්‍යක්ෂ ධූරයට බඳවාගෙන 2016 මැයි මස සිට 2019 පෙබරවාරි දක්වා රු.2,989,008ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | මෙම පත් කිරීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ පනත යටතේ විමර්ෂණයක් සිදුවන බැවින් ගන්නා ක්‍රියාමාර්ගය ඉදිරියේදී දැනුම් දෙන බව | චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරිනියකගේ සේවාව ලබාගැනීමේදී ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතුයි. |
| (ආ) | 2013 වර්ෂයේ අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු අලෙවි අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2015 ජුනි 26 දින සිට 2019 අගෝස්තු 31 දක්වා රු.6,558,768 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි | සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව ලබාගෙන ඇති උපාධිය හා සුදුසුකම් පරීක්ෂා කොට අමාත්‍යාංශයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පත්වීම ලබාදී ඇති බව | අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සේවයට බඳවා ගතයුතු බව හා සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ සපුරා ඇති සුදුසුකම් අදාල කරගත යුතුයි. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 සිට 2014 දක්වා වූ කාල පර්ච්ඡේදයේ සිට මණ්ඩලයේ විවිධ අංශ වලින් ලැබිය යුතු රු.11,530,544 කට අදාල ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට හෝ නිරවුල් කරගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 හා 2017 කාල පරිච්ඡේදයට අදාල රු.8,201,353ක් වූ කාර්මික ජනපද වලින් අයවිය යුතු ශේෂ අයකර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ කඩිනමින් පියවන ලෙසට හා නැතිනම් ගිවිසුම් ප්‍රකාර කටයුතු කරන බවට දන්වා ඇති බව | අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුයි. |
| (ඇ) | එකතුව රු.4,605,647කට අදාල ආර්ථික සේවා ගාස්තු, රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල්, වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු මුදල් හා කිතුල් අලෙවි ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආර්ථික සේවා ගාස්තු මණ්ඩලයට උපචිත වේද යන්න ගැටළු සහගත බවත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී ගිණුම් වලින් ගැලපීමටත් වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු මුදල් හා කිතුල් අලෙවි ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන බව | අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කලයුතුයි. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.32,035,643ක් වූ පෙර ගෙවූ මුදලින් 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිරවුල් නොවූ ශේෂය රු.12,824,409 ක් වී තිබුණි. මෙම ශේෂයන් තුල වූ විවිධ වියදම් වලින් රු,6,715,710ක් සඳහා සහ පෙර ගෙවූ අත්තිකාරම් මුදල් වලින් රු.4,960,541 ක් වශයෙන් එකතුව රු.11,676,251ක මුදලක් සඳහා වෙන්කිරීමක් කර තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලය සමඟ දැනටත් ගණුදෙනු කරමින් පැවතුණ ද අබලි අත්තිකාරම් වශයෙන් පෙර ගෙවුම් ලෙස ගෙවා ඇති මුදල් වෙනුවෙන් අබලි තොග ලබා ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොමැති බව | ශේෂ පිළිබඳ පරීක්ෂා කර නිරවුල් කිරීමට පියවර ගතයුතුයි. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට අයත් දේපල සඳහා ගෙවිය යුතු රු.12,566,609කට අදාල වරිපනම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය වාණිජ ලෙසට සළකා වරිපනම් බදු අයකර තිබෙන දේපල රාජ්‍ය සේවා යටතට ගෙන ඒමට අවශ්‍ය ක්‍රියාමාර්ග වලට මේ වන විටත් එළඹ ඇති බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 හා 2016 වර්ෂ වල සිට පැවත එන එකතුව රු.6,347,911කට අදාල ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | රු.195.132 කට අදාල ශේෂය ගෙවා නොමැති බවත්, රු.3,751,347 කට අදාල ශේෂය පිළිබඳව සොයා බලා සටහන් ආපසු හැරවීමටත්, ඉතිරි ශේෂයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 | ලක්කම් අලෙවිසැලේ මුදල් අයකැමි විසින් ඇප තබා නොතිබුණි. | කඩිනමින් විසඳුමක් ලබාදෙන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුයි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 2015/3 දරන මුදල් චක්‍රලේඛයේ 2 ආ ජේදය | සම්භාණ්ඩ අංශයේ වැඩ සටහන් පැවැත්වීමට අදාලව අවස්ථා 04 කදී රු.100,000 ඉක්ම වන පරිදි අත්තිකාරම් ලබාදී තිබුණි | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.27,043,402 ක් වූ ස්ථාවර තැන්පතු 3 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ආපසු මුදල් කර තිබුණි. | සභාපතිගේ අනුමැතිය මත මුදල් කර ඇති බව | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුයි |
| (ආ) | මාණ්ඩලික නිලධාරීන් හට අත්තිකාරම් ලබාදීමේදී ප්‍රමාණවත් ඇස්තමේන්තු කිරීමක් නොමැති හෙයින් අසාමාන්‍ය ඉතිරිකිරීම් දක්නට ලැබුණ අතර, ඉතිරිවීම් සියයට 22 සිට සියයට 86 දක්වා වූ පරාසයක් පුරා විහිදී තිබුණි | පිළිතුරු ලබාදී නොමැත | ඇස්තමේන්තු නිවැරදිව සකස් කලයුතුයි. |

## 1.9 තොරතුරු තාක්ෂණ ( IT) පොදු පාලන ක්‍රම

----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ගිණුම්තැබීම සඳහා "sage" මෘදුකාංගය යොදාගෙන තිබුණද ඒහි සම්බන්ධතාවය ගබඩාව ඇතුළු අනෙකුත් අංශ වෙත ලබාදී නොතිබුණි. ඒම නිසා ගබඩාද්‍රව්‍ය ඉල්ලුම් කිරීමේ සිට ද්‍රව්‍ය ගබඩාවට භාරදෙන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලිය සඳහා මෙම මෘදුකාංගය අදාල කරගෙන ගබඩා කටයුතු කාර්යක්ෂම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මෘදුකාංගයේ සම්බන්ධතාවය සෑම අංශයකටම ලබාදී ඒහි ඇති පහසුකම් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුයි |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,848,528 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.13,137,868ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,986,396ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම හා රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

--------------------------------------------------------------------------

| | 2017 | 2018 |
|---|---|---|
| | රු | රු |
| අබලි යකඩ ආදායම | 159,591,517 | 325,738,660 |
| අනෙකුත් ආදායම් | 124,337,247 | 139,761,899 |
| මුළු ආදායම | 283,928,764 | 465,560,559 |
| පරිපාලන වියදම | 490,715,818 | 549,535,526 |

පෙර වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ මුළු ආදායම සියයට 64 කින් වැඩිවී තිබුණි. රු.465,560,559ක් වූ මුළු ආදායමෙන් සියයට 70 ක් ඒනම් රු.325,738,660ක් අබලි යකඩ විකිනීමෙන් ලද ආදායම වන අතර මණ්ඩලයේ ප්‍රධාන අරමුණ හා කාර්යභාරය ඉටුකරගැනීමට අදාල කාර්යයන් වෙනුවෙන් දායකත්වය සියයට 30 ක් එනම් රු.139,761,899ක අඩු මට්ටමක පැවතුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| | 2017 | 2018 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.4 | 1 : 1.5 |
| දළ ලාභ අනුපාතය | 34.2 | 30.59 |
| ශුද්ධ ලාභ අනුපාතය | (6.17) | 0.08 |

සියයට 30.59 ක දලලාභ අනුපාතයක් පැවතුනද ශුද්ධ ලාභ අනුපාතය සියයට 0.8 ක් වීමට රු.549,535,526ක පරිපාලන වියදම හේතුවී තිබුණි. නමුත් වෙනත් ආදායම් වන රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය වටිනාකම රු 16,691,220 කින් වැඩිවීම හා පුනරාවර්තන ප්‍රදාන රු.17,000,000කින් වැඩිවීම මණ්ඩලයේ ලාභදායිත්වයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. 2017 වර්ෂයේ රු.36,675,065ක්ව පැවති කාරක ප්‍රාග්ධනය 2018 වර්ෂයේ රු.32,389,652 දක්වා රු.4,285,413කින් අඩුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක සේවාව ලබාගැනීමට අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානයේදී දෙවන අවම මිල ඉදිරිපත් කල සමාගම විසින් ආරක්ෂක බලපත්‍රය හා සමාගම් සංස්ථාපන සහතිකය ඉදිරිපත් නොකිරීම මත ප්‍රතික්ෂේප වී තිබුණු අතර එම නිසා තෙවන අවමමිල ඉදිරිපත්කල සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම හේතුවෙන් මණ්ඩලයට රු.1,803,100ක පාඩුවක් සිදුවී තිබුණි.දෙවන මිල ඉදිරිපත් කල ආයතනය සමඟ සාකච්ඡා කලේ නම් පාඩුව අවම කරගත හැකිව තිබුණි. | දෙවන අවම මිල ඉදිරිපත් කල ලංසු කරු විසින් ලේඛණ වල සහතික කල පිටපත් ඉදිරිපත් නොකිරීම මත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අසාර්ථක ටෙන්ඩර් කරුවකු ලෙස නිර්දේශ කල බව | අවාසි අවම වන ආකාරයට කටයුතු කළයුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 වර්ෂයේ සිට 2012 ජූලි මාසය දක්වා ජීවන වියදම් දීමනාව වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එම ණය පියවීමේදී රු.4,313,194ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. | මෙම තත්ත්වය නැවත උද්ගත නොවන ලෙස ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට ප්‍රේෂණය කරන බව | අදාල ගෙවීම් නියමිත කාල වලදී සිදු කළයුතුයි |
| (ඇ) | අබලි ට්‍රාන්ස්ෆෝමර් මිලට ගැනීමේදී වැට් බදු ඇතුළත්ව ගෙවීම් කර තිබුණද රු.64,747,050කට කර්මාන්තකරුවන්ට විකුණූ අබලි ට්‍රාන්ස්ෆෝමර් සඳහා වැට් බදු අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.9,697,057ක පාඩුවක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි. | 2018 වර්ෂයේ වැට් බදු අයකරගෙන ඇත්තේ වැට් බදු සඳහා ලියාපදිංචි කර්මාන්තකරුවන්ගෙන් පමණක් බව හා එක් කර්මාන්තකරුවකුගෙන් අයකරගෙන ඇති බව | වැට් බදු අයකර ගැනීමට වැට්බදු සඳහා ලියාපදිංචිය අවශ්‍ය නොවන බව හා මිලදී ගැනීමේදී වැට් බදු ගෙවන බැවින් විකිණීමේදීත් එම ගෙවන ලද බදු මුදල අයකර ගතයුතුයි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වලින් බැහැර කරන අබලිලෝහ සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත සංවර්ධනය සඳහා සාධාරණ පදනමකින් බෙදාහැරිය යුතු වුවත් 2018 වර්ෂයේ බෙදාහල පිත්තල කිලෝග්‍රැම් 242,531 කින් 41% එනම් කිලෝග්‍රැම් 100,004 ක් එක් කර්මාන්තකරුවෙකුට සභාපතිවරයාගේ අනුමැතිය හා නිර්දේශය ලබාදී තිබුණු අතර, ලංකා විදුලි බල මණ්ඩලයෙන් මිලදිගත් ට්‍රාන්ස්ෆෝමර් 1185 න් 781 ක් ඉහත පිත්තල ලබාදුන් කර්මාන්තකරු ඇතුළු කර්මාන්තකරුවන් දෙදෙනෙකුට පමණක් ලබාදී තිබුණි. | විශේෂඥ කමිටුවක් මඟින් පරීක්ෂා කර එවකට සිටි මණ්ඩලයේ ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය හා අනුමැතිය මත නිකුත් කල බව | සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත සංවර්ධනය සඳහා සාධාරණ පදනමකින් බෙදාහැරිය යුතුයි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) රෝබෝ තාක්ෂණය සඳහාවූ ව්‍යාපෘතිය** | | |
| I. ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ක්‍රියාවලීන් යාන්ත්‍රික කිරීම, ඵලදායිතාවය ඉහල නැංවීම, තත්වය උසස් කිරීම,මානව අත්වැරදීම් අවම කිරීම, කාර්මික අවශ්‍යතාවලට සවියක් වීම ආදිය අරමුණු කරගෙන රෝබෝ තාක්ෂණය හඳුන්වා දීම සඳහා අමප16/1424/723/039 හා 2016 අගෝස්තු 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබ මණ්ඩලයේ ගොඩනැගිල්ලක මෙම මධ්‍යස්ථානය ආරම්භකර තිබුණි. පස් අවුරුදු සැලැස්මක් යටතේ රු මිලියන 80 ක රජයේ දායකත්වය මත මෙම මධ්‍යස්ථානය පිහිටුවීමට සැලසුම් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල යෝජනා අනුව 50:50 අනුපාතයක් නියෝජනය කරන පොදු හා පුද්ගලික හවුල්කාරිත්වයක් සහිත පාලක මණ්ඩලයක් මගින් මධ්‍යස්ථානය පාලනය කල යුතු මෙන්ම මේ සඳහා සමාගමක් වශයෙන් ලියාපදිංචි කල යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටත් සමාගමක් වශයෙන් ලියාපදිංචි කර නොතිබුණු අතරම අමාත්‍ය මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට විද්‍යා හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත ගැසට් පත්‍රය මගින් පවරා ඇති බැවින් පොදු හා පුද්ගලික හවුල්කාරිත්වයක් සහිත පාලක මණ්ඩලයක් මගින් පාලනය වන සමාගමක් වශයෙන් ලියාපදිංචි කිරීම හා ඉදිරි කටයුතු කල නොහැකි බව | අමාතය මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කලයුතුයි |
| II. 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දක්වා රු.117,830,891ක මුදලක් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබුණි. 2019 සැප්තැම්බර් දක්වා මුළු වියදම රු.118,638,671 (වැටිබදු හැර) ක් වූ අතර ගිවිසුම්ගත බැඳීම් වෙනුවෙන් තවදුරටත් ගෙවීමට ඇති මුදල රු.24,526,958ක් වී තිබුණි. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හා සංශෝධිත සැලැස්මක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතිය නොනවත්වා ඉදිරියට කරගෙන යාමේ අරමුණෙන් අවශ්‍ය අමතර වියදම සඳහා මිලියන 75 ක් අමාත්‍යාංශයෙන් ඉල්ලීමට කටයුතු කර ඇති බව | රජයේ දායකත්වය රු මිලියන 80 සඳහා හා ඒ වෙනුවෙන් වූ සැලැස්ම සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගතයුතුයි. |
| III. රු.මිලියන 40 ක වටිනාකමැති රෝබෝ යන්ත්‍ර 4 ක් 2017 අප්‍රේල් මස මිලදි ගෙන සවිකර තිබුණු අතර 2018 වර්ෂය තුල මිලදීගත් රු.11,606,580ක් වූ කාර්යාල උපකරණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 15 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුනි. | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කල නොහැකි වීම හේතුවෙන් වත්කම් නිෂ්කාර්ය වෙමින් පවතින බව | විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශ යන අමාත්‍යාංශ දෙකෙහි ඉහල කළමනාකාරිත්වය විසින් පොදු එකඟත්වයක් මත නැවත ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| IV. | ව්‍යාපෘතිය ආරම්භ කර ඇති ගොඩනැගිල්ල නවීකරණය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 4.5 ක් වූ අතර, ඒ සඳහා රු.29,486,450 ක් වැය කර තිබුණි.තවද මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙහි අයිතිය නිත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. මෙවැනි විශේෂිත මධ්‍යස්ථානයක් පිහිටුවීම වෙනුවෙන් එය පිහිටුවීමට පෙර ඊට අවශ්‍ය සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට මණ්ඩලයට නොහැකිවී නොතිබුණි. | නිශ්චිත ස්ථානයක් තෝරා නොගෙන ඇස්තමේන්තු කර ඇති බවත් ඉඩමෙහි අයිතිය නීති ප්‍රකාරව සිදුවෙමින් පවතින බව | ඇස්තමේන්තු නොඉක්මවන ලෙස කටයුතු කළ යුතු අතරම ඉඩමෙහි නිත්‍යානුකූල අයිතිය පවරා ගෙන ව්‍යාපෘතිය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කළ යුතුයි. |
| V. | ව්‍යාපෘතියට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජුනි 20 දිනැති DMS/1840 ලිපිය අනුව අනුමත කාර්ය මණ්ඩලය දක්වා තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කර නොතිබුණි. ප්‍රධාන විධායක නිලධාරි තනතුර ඊට ඇතුළත් කර නොතිබුණද ව්‍යාපෘතිය කරගෙනයාම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2017 සැප්තැම්බර් 08 දිනැති PMO/01/ASR(CCEM)/2017/01 ලිපිය අනුව ප්‍රධාන විධායක නිලධාරි තනතුරට නිලධාරියකු බඳවාගෙන තිබුණි. මාසික වැටුප රු.725,000ක් හා ප්‍රවාහන දීමනා ඇතුළුව මාස 06 ක් වෙනුවෙන් අනුමැතිය ලබා දී තිබුණද 2017 නොවැම්බර් 15 සිට 2018 දෙසැම්බර් මස දක්වා මාස 12 ½ ක් අදාල තනතුරේ කටයුතු කර ඒ සඳහා රු.12,035,025ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. අනුමැතියෙන් බැහැරව සේවය කල මාස 61/2 ක කාලය වෙනුවෙන් ගෙවා තිබූ වැටුප් හා දීමනා ව රු.6,401,910ක් විය. | ප්‍රධාන විධායක නිලධාරි සම්මුඛ පරීක්ෂණයක් මඟින් නිසි පරිදි බඳවාගෙන ඇති බවත් අනෙකුත් කාර්ය මණ්ඩලය පත් කිරීම ඇන හිට ඇති බව හා ප්‍රධාන විධායක නිලධාරිගේ සේවය දීර්ග කිරීමටත් වැටුප් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව | අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කර අනුමත කාර්ය මණ්ඩලය තුල පමණක් නිලධාරීන් බඳවා ගත යුතු අතර අනුමැතියකින් තොරව බඳවා ගැනීම් හා වැටුප් ගෙවීම් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගතයුතුයි. |
| VI. | මණ්ඩලය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් මානව සම්පත් උපදේශන කටයුතු සමාගම් ලියාපදිංචි කිරීම් වෙනුවෙන් නීතිඥ සේවාවන් වෙනුවෙන්, සාංගමික ව්‍යවස්ථාවලිය සකස්කිරීම, හා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම සඳහා උපදේශක ආයතන හා වෘත්තිමය ආයතන වල සේවාව සඳහා රු.1,787,828ක් වැය කර ලබා ගෙන තිබූ අතර, අදාල සේවාව ලබාගැනීම සම්බන්ධව ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කර නොතිබුණි. | උපදේශන කටයුතු සඳහා ආයතනයක් තෝරාගෙන ඊට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව | ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කලයුතුයි. |
| VII. | 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2013/34 දරන ගැසට් පත්‍රය මගින් මෙම මධ්‍යස්ථානය විද්‍යා හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත පවරා ඇත. නමුත් 2019 අගෝස්තු 02 දින මෙම ව්‍යාපෘතියට අදාලව රු.35,788,924කට සීඑන්සි මිල් යන්ත්‍ර 02 ක් මිලදී ගෙන ස්ථාපනය කර තිබුණි. පිරිවිතර ඇගයීම් කරන අවස්ථාවේ පත් කර තිබූ තාක්ෂණික ඇගයීම් | ඉහළ කලමණාකාරිත්වයේ තීරණ අනුව ඉංජිනේරු අංශයේ ගොඩනැගිල්ලක මෙම යන්ත්‍ර ස්ථාපිත කර යටිතල පහසුකම් | ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කර වත්කම් ඵලදායිව භාවිතා කලයුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කම්ටුවේ සමාජිකයින් ඉදිරි යන්ත්‍ර භාවිතයේදී මිල අධික මෘදුකාංග හා විශේෂිත ඉංජිනේරුවකු මේ සඳහා අවශ්‍ය බව හා එසේ නොමැති විටෙක අදාල යන්ත්‍ර නිෂ්කාර්ය වන බව සඳහන් කර තිබුණි. අවශ්‍ය මෘදුකාංග, යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය ස්ථාපිත කර ඇති "නවබිම" ගොඩනැගිල්ලෙන් බැහැරව මෙම යන්ත්‍ර කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ ගොඩනැගිල්ලක ස්ථාපිත කර තිබුණු අතර මෙය ස්ථාපිත කල දින සිට මේ දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි. | ලබාදී ඇති බව | |
| (ආ) | I. | ක්‍රියාකාරී කාර්මික ජනපද 18 හි මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 275 න් කර්මාන්තකරුවන්ට බෙදා දුන් බිම් කොටස් ප්‍රමාණය අක්කර 173 ක් විය. එයින් යම් ප්‍රමාණයක් මණ්ඩලයේ ජනපද කාර්යාලවලට, මාර්ග පද්ධති හා අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් වෙන් විය හැකි වුවද සංවර්ධිත බිම් කොටස් 72 ක් එනම් අක්කර 10 පර් 20 ක් තවදුරටත් කර්මාන්තකරුවන් හට බෙදා දීමට ඉතිරිව පැවතුණි. ඒ අනුව අත්පත් කර ගත් ඉඩම් ප්‍රමාණයට සාපේක්ෂව භාවිතා කරන ප්‍රමාණය ඉතාමත් අඩු මට්ටමක පැවතුණි., එම බෙදා දුන් බිම් කොටස් 725 න් බිම් කොටස් 42 ක් පුද්ගලික පදිංචියට යොදාගෙන ඇති අතර කර්මාන්ත ලෙස පවත්වාගෙන ගොස් වසාදැමූ සංවර්ධන බිම් කොටස් ගණන 34 ක් පමණ විය. | මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 275ක් බවත් කර්මාන්තකරුවන්ට බෙදා දුන් බිම් කොටස් ප්‍රමාණය අක්කර 173 ක් බව හා බිම් කොටස් 72 ඉදිරියේදී බෙදාදෙන බව පුද්ගලික පදිංචියට යොදාගෙන ඇති හා කර්මාන්ත වසා ඇති කොටස් කර්මාන්තකරුවන් ගේ ඉල්ලීම පරිදි බෙදා දෙන බව | අත්පත් කර ගත් ඉඩමෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කලයුතුයි. |
| | II. | වත්කම් වටිනාකම රු.2,528,307ක් වූ කාර්මික ජනපද 03 ක් මණ්ඩලයේ අයිතිය හා පාලනය යටතේ දැනට ක්‍රියාත්මක නොවන අතර වත්කම් වටිනාකම රු.24,203,318ක් වූ ජනපද 04 ක ආදායම උත්පාදනය දිගුකලක සිට නතර වී තිබුණි. නමුත් එම ජනපද වෙනුවෙන් 2018 වර්ෂයේදී වාර්ෂිකව වියදම් ලෙස රු.1,507,735 ක් දරා තිබුණි. කාර්මික ජනපද 14 න් ජනපද 06 කම අදායම් ඉක්මවා ගිය වියදම රු .6,419,777ක් වී තිබුණි. | මණ්ඩලයේ අයිතිය හා පාලනය යටතේ දැනට ක්‍රියාත්මක නොවන ජනපද 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් ගැලපීම් කරන බවත් අසාර්ථක ජනපද සඳහා තීරණයක් ගන්නා බව හා ආදායම ඉහල නැංවීම සීමා වී ඇති බව | වියදම් අවම වන ලෙස කටයුතු කලයුතු බව හා ක්‍රියාත්මක නොවන ජනපද සංවර්ධනය කොට කර්මාන්තකරුවන්ට ලබාදිය යුතුයි. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.2,070,379ක් වූ ටෝනර් වර්ග 289 ක් ගබඩාවේ පැවති අතර ඉන් වටිනාකම රු.1,421,416ක් වූ ටෝනර් වර්ග 219 වසර 1 සිට 21 දක්වා පැරණි තොගවේ. මෙම තොග තවදුරටත් බෙදාහැරීමකින් තොරව ගබඩාවේ තිබුණි. | අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් බැවින් කඩිනමින් නිවැරදි කරන බව | අවශ්‍ය තොග මට්ටම් තීරණය කර ප්‍රමාණවත් පරිදි තොග ගබඩාවේ පවත්වාගෙන යා යුතුයි. |
| (ආ) | හොරණ කාර්මික ජනපදයේ අංක 15 ට අදාළ රූඩ් 1 පර්චස් 0.6 ක් වූ බිම් කොටස බදු ගිවිසුම් අංක 254 යටතේ 2011 අප්‍රේල් 28 දින සිට කර්මාන්තකරුවෙකුට කුලී පදනම මත ලබාදී තිබුණ අතර, 2014 අප්‍රේල් 23 දින සිට අඵත්වැඩියාවක් වශයෙන් සඳහන් කර නිෂ්පාදන කටයුතු නතර කොට තිබුණි. නිෂ්පාදන කටයුතු නතර කිරීම හා හිඟ මුදල් නොගෙවීම මත 2015 සැප්තැම්බර් 08 දින ගිවිසුම අවලංගු කර තිබුණ අතර, කර්මාන්තකරුගේ ඉල්ලීම අනුව 2016 අප්‍රේල් 06 දින නැවත කර්මාන්තකරු වෙත පවරා තිබුණි. එම කර්මාන්තකරු විසින් ලංකා බැංකුවෙන් ලබාගත් ණයක් නොගෙවීම හේතු කොට ගෙන බැංකුව විසින් බදු අයිතිය පවරා ගෙන තිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දින වන විටත් මෙම දේපළ වෙනත් කර්මාන්තකරුවෙකුට නොපවරා ඌන උපයෝජිතව පැවතුණි. | මෙහි බදු අයිතිය MDK සමාගමට පැවරීමට ලංකා බැංකුව කටයුතු කරමින් සිටින බව හා පැවරීමේ කටයුතු අවසන් වීමෙන් පසු නව කර්මාන්තය ඇරඹීමට කටයුතු කරන බව | කර්මාන්තය පවරා හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුයි. |
| (ඇ) | ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති නිසි ලෙස ඇගයීම් කර තෝරා නොගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම හේතු කොට ගෙන වැඩසටහන් යටතේ ලැබුණු රු.3,051,889ක මුදලින් මිලට ගත් රු.1,547,392 ක් වටිනා උපකරණ 2019 ඔක්තෝබර් වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා හැර නොතිබුණු අතර, කර්මාන්ත කරුවන් සඳහා බෙදා දීම පිණිස 2007-2016 කාල පරිච්ඡේදය තුලදී මිලට ගත් රු.3,257,173ක් වටිනා භාණ්ඩ බෙදා හැරීමටද කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයට ප්‍රතිපාදන ප්‍රමාද වීම හා දිවියට උදානය වැඩසටහන සඳහා පූර්ණ කාලය යෙදවීම නිසා බව. | ප්‍රතිලාභීන් තෝරාගෙන මිලදීගත් භාණ්ඩ අප්‍රමාදව බෙදාහැරිය යුතුයි. |
| (ඈ) | ව්‍යවසායකත්ව ගම්මාන හා කාන්තා සංවර්ධන වැඩසටහන් යටතේ අමාත්‍යාංශයෙන් ලද රු.800,000 මුදලින් 2018 පෙබරවාරි 26 දින මිලට ගත් රු.334,475ක් වූ පෙට්ටි කුට්ටම් යන්ත්‍රය 2019 ඔක්තෝබර් වන විටත් බෙදා හැර නොතිබුණි. | පොදු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් ලබාගැනීමට ප්‍රමාද වූ බව | මිලදීගත් භාණ්ඩ අප්‍රමාදව බෙදාහැරිය යුතුයි. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පානළුව කාර්මික ජනපදයේ වර්ග අඩි 1650 ක් වු මායිම් තාප්පය සඳහා ප්‍රමාණවත් පරීක්ෂාවකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් 2017 මාර්තු 28 ප්‍රසම්පාදන කමිටුව අනුමත කල රු.20,763,350ක් වූ ඇස්තමේන්තුව වර්ග අඩි 1,810 ක් දක්වා රු.33,158,180 දක්වා වැඩිවී තිබුණි. අතිරේක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ප්‍රමාද වීම හා මුදල් ගෙවීමේ ප්‍රමාදය නිසා 2018 අප්‍රේල් 08 දිනට නිම වීමට තිබූ මෙම ව්‍යාපෘතිය මෙම වාර්තාවේ දින වන විට තාවකාලිකව නතර කර තිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වරින් වර ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා අමාත්‍යාංශය ප්‍රතිපාදන නිදහස් කිරීම ප්‍රමාද වීම මත ඉදිකිරීම් සම්පූර්න කල නොහැකිවූ බව | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ප්‍රමාණවත් පරීක්ෂාවකින් ඇස්තමේන්තු සකස් කලයුතු බව හා මුදල් ගෙවීම් අප්‍රමාදව සිදු කලයුතුයි. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නවබිම ගොඩනැගිල්ල කොටස් වෙන් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.4,032,408ක මුදලකට පුද්ගලික සමාගමකට 2018 අප්‍රේල් 12 දින ප්‍රදානය කර රු.2,685,128ක් මේ දක්වා ගෙවීම් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීම් සඳහා දින 21 ලබාදීම, 8.9.1(අ) අනුව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම 8.7.1 අනුව ප්‍රතිපාදන ඇති බවට 8.12.2 අනුව වැඩ අවසන් සහතික ලබා දීම හා 4.3.1(අ) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම වශයෙන් වන වගන්ති වලට අනුකූල වන පරිදි ඉහත කාර්යය ඉටු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කර මෙවැනි තත්ත්වයන් ඇතිවීම වළක්වා ගැනීමට කටයුතු කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකර කටයුතු කලයුතුයි. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුර කණිෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක් වන අතර තනතුර 94 ක් සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී තිබුණි. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR64/2009 දරන නඩු තීන්දුව පදනම් කරගෙන නිලධාරීන් 55 දෙනෙකු සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකාර වශයෙන් මධ්‍යම කළමණාකාර මට්ටම ලබාදී තිබුණි. ඒ අනුව පත්වීම් දිනය වූ 2016 ජුනි 23 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා දළ වශයෙන් රු.මිලියන 60 ක මුදලක් දල වැටුප් වශයෙන් ද 2018 වර්ෂය සඳහා ගෙවූ වෘත්තීය දීමනාව රු.2,520,000 ක්ද වී තිබුණි. මෙම තනතුරු සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කණිෂ්ඨ හෝ මධ්‍යම කළමණාකරන මට්ටමේ පිහිටුවන ලෙස නඩු තීන්දුවෙහි දැක්වෙන බව හා යෝජිත කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරන සැලැස්ම තුලින් මෙම ගැටළුව නිරාකරණය වන බව | තනතුරු ලබාදීමට පෙර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුයි. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නොවූ උපදේශක තනතුර සඳහා නිළධාරියකු 2015 වර්ෂයේ සිට බඳවාගෙන එදින සිට වැටුප් හා දීමනා වශයෙන් රු.1,066.462ක මුදලක් ගෙවා තිබුණි | පිළිතුරු ලබාදී නොමැත | අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම් නොකල යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 03 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කලයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශ 2019 ජූලි 27 දින ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුයි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන විගණන පනතේ 38(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගනන්දීමේ නිලධාරි විසින් සහතික වියයුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාව පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබියයුතු බවත් 38(2) වගන්තිය ප්‍රකාරව එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එවැනි සමාලෝචනයක් කල බවට තොරතුරු වාර්තා නොවීය. | පිළිතුරු ලබාදී නොමැත | විගණන පනත ප්‍රකාරව කටයුතු කළයුතුයි. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ සියළු අරමුණු ඉටු වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණු අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශක කරා ලඟා වීම දුර්වල මට්ටමක පැවතුණි. වැඩ සටහන් පැවැත්වීම ප්‍රධාන කොට ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණු අතර නව තාක්ෂණය කාර්මික ක්‍රම දියුණු කිරීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීමට හැකි වන පරිදි කටයුතු කලයුතුයි. |

## 4.4 අයවැය පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාරයෙන්, අමාත්‍යාංශයෙන් හා මණ්ඩලයේ ආදායම් ඇතුළු සියළු ආදායම් හා ප්‍රාග්ධන, පුනරාවර්තන වියදම් ඇතුලත් කර වාර්ෂික අයවැය පිළියෙල කර නොතිබුණු අතර මහා භාණ්ඩාගාරයෙන් ලද රු මිලියන 65.4 ක් වූ මුදල සඳහා පමනක් ප්‍රාග්ධන අයවැයක් පිළියෙල කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | සමස්ථ ආදායම් වියදම් ආවරණය වන පරිදි වාර්ෂිත අයවැය සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුයි. |

## 4.5 මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් A 520 දරන අබලි නෞකාව කපා ඉවත් කිරීම සඳහා මණ්ඩලය විසින් මිලගණන් කැඳවා රු.18,341,640ක් වූ වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ මහවැලි අයන් සෙන්ටර් වෙත 2015 ජනවාරි 02 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් නෞකාව මණ්ඩලයට පවරා තිබුනේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසරකට පසු එනම් 2016 මාර්තු 18 දිනවේ. ඒ අනුව නීත්‍යානුකූල හිමිකාරිත්වයක් නොමැතිව ප්‍රසම්පාදනය සිදු කර මුදල් ලබාගෙන තිබුණි. 2016 අප්‍රේල් 28 වන විට නෞකාව කපා ඉවත් කිරීමේ කටයුතු අවසන් කර තිබුණද 2019 ඔක්තෝබර් වන විටත් ගැණුම්කරුගෙන් ලබාගත් රු.1,620,000ක් වූ කාර්යසාධන ඇප මුදල නිදහස් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 15 දින මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.14 වගන්තිය අනුව ආරවුල් විසඳීමේ වගන්ති ඇතුලත් කොට විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ඉදිරියේදී අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. | මේ සමබන්ධයෙන් බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් පිළිතුරු ලබාදිය නොහැකි බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.14 වගන්තිය අනුව ආරවුල් විසඳීමේ වගන්ති ඇතුලත් කොට ඉදිරි ගිවිසුම් වලට එළබෙන බව | නීත්‍යානුකූල හිමිකාරිත්වයක් ඇතිව ප්‍රසම්පාදනය සිදුකලයුතු බව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතුයි. |